# දැන්වීමයි

## දෙවන වසර (2020) පළමු වර්ෂාර්ධය සඳහා සහ දෙවන, තෙවන හා සිව්වන වසර (2019, 2018, 2016/2017,) දෙවන වර්ෂාර්ධය සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීම

කළමනාකරණ අධ්‍යයන පීඨයේ ඉහත අධ්‍යයන වර්ෂවලට අයත් සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් තම **ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීම සඳහා 2019, 2018, 2016/2017 යන අධ්‍යයන වර්ෂ වලට අයත් සිසුන් හැර, 2020 පළමු අධ්‍යයන වර්ෂයට අයත් සිසුන් පමණක් රු. 150.00 ක ලියාපදිංචි ගාස්තුවක් ගෙවිය යුතුය.**

ඒ සඳහා ඉහත මුදල **ගිණුම් අංක 008100181725841 දරණ මහජන බැංකුවේ මිහින්තලේ ශාඛාව** වෙත ගෙවා අදාල කුවිතාන්සියේ පිටපත කාර්යාලයට භාර දී ලියාපදිංචිය අලුත් කර ගත් බවට ශිෂ්‍ය වාර්තාපොතේ සටහන් කරවා ගත යුතු වේ. ශිෂ්‍ය වාර්තා පොත අලුත් කිරීමේදී අදාල වර්ෂාර්ධයේ තමන් විසින් හදාරනු ලබන විෂයයන් සටහන් කොට ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙතින් අත්සන් කර ගත යුතු වේ.

**ඉහත දිනට පෙර ලියාපදිංචිය අලුත් කර නොගන්නා සිසුන්ට වර්ෂාර්ධ පරීක්ෂණ සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් නොකරන අතර මහපොළ හා ශිෂ්‍යාධාර වාරික ද පුස්තකාල සේවා පහසුකම් ද ලැබීමට හිමිකම් නොලැබෙන බැව් වැඩිදුරටත් දන්වා සිටිමි.**

ශිෂ්‍ය වාර්තා පොත් පීඨ කාර්යාලයට ගන්නා සහ නැවත ලබා ගත හැකි දිනයන් පහත පරිදි වේ.

| අධ්‍යයන වර්ෂය | භාර දී ඇති ශිෂ්‍ය වාර්තා පොත් නිකුත් කිරීම | ශිෂ්‍ය වාර්තා පොත් භාර ගැනීම | ශිෂ්‍ය වාර්තා පොත් නිකුත් කිරීම |
|---|---|---|---|
| 2020 | 2022.06.20 | 2022.06.23 | 2022.06.30 |
| 2019 | 2022.06.08 | 2022.06.10 | 2022.06.17 |
| 2018 | | | |
| 2016/2017 | ආයතනික පුහුණු කාල සීමාව බැවින් සතියේ දිනවලදී ලබා ගත හැක | | |

*සැ. යු. : ශිෂ්‍ය වාර්තා පොත පීඨයට භාර දීමේදී හා ආපසු ලබා ගැනීමේදී පීඨ කාර්යාලයේ ඇති ලේඛනයේ අත්සන යෙදීම අනිවාර්ය බව සලකන්න.*

***නියමිත දිනට පෙර ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කර නොගන්නා සිසුන්ගෙන් පහත පරිදි දඩ මුදල් අයකරනු ලැබේ.***

- *නියමිත දිනට පසු ප්‍රමාද වන සති දෙකකට ලියාපදිංචි ගාස්තුව සහ එයට අදාල 25% ක දඩ මුදලක්.*
- *නියමිත දිනට පසු ප්‍රමාද වන සති හතරකට ලියාපදිංචි ගාස්තුව සහ එයට අදාල 50% ක දඩ මුදලක්.*
- *ඉන් පසු ප්‍රමාද වන දිනයන් සඳහා ලියාපදිංචි ගාස්තුව මෙන් දෙගුණයක් සහ පීඨ මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු වේ.*

W3.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
කළමනාකරණ අධ්‍යයන පීඨය
2022.06.08

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී**
**කළමනාකරණ අධ්‍යයන පීඨය**
**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**
**මිහින්තලේ**